# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2205/3 - 2020 දෙසැම්බර් මස 08 වැනි අඟහරුවාදා - 2020.12.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ 1 වැනි ඡේදයේ නියමයන්ට අනුකූලව පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද, අංක 2193/30 හා 2020.09.16 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධිත, අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පළ කරනු ලැබ ඇති උපලේඛනයේ I වැනි කොටසේ, අංක 17 සහ 18 යටතේ පවතින විධිවිධාන 2020.11.24 දින සිට බලපවත්වන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2.

| *I තීරුව*<br>*නිලධාරි ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 17. ජාතික විගණන කාර්යාලයේ-<br>(අ) ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධරයන්.<br><br>(ආ) විගණන පරීක්ෂක සේවයට අයත් අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන්. | විගණකාධිපතිවරයා විසින් නම් කරනු ලබන නියෝජ්‍ය විගණකාධිපතිවරයකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවල අනුකූල ස්ථාන මාරු කිරීම.<br><br>(II) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 18. ජාතික විගණන කාර්යාලයේ-<br>(අ) අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන් නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමට අයත් විගණන පරීක්ෂක සේවයේ නිලධරයන්.<br>(ආ) ඒකාබද්ධ සේවාවලට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික හා ද්විතීයික මට්ටමේ නිලධරයන්. | විගණකාධිපතිවරයා විසින් නම් කරනු ලබන නියෝජ්‍ය විගණකාධිපතිවරයකු. | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි / සේවා ව්‍යවස්ථා අනුව පත් කිරීම සහ උසස් කිරීම.<br>(II) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූල ස්ථාන මාරු කිරීම.<br>(III) විනය පාලනය හා සේවයෙන් පහකිරීම. |

3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයෙහි සඳහන් අනෙකුත් කරුණු සහ ඒ සඳහා විටින් විට කර ඇති සංශෝධනයන් නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 දෙසැම්බර් මස 03 වැනි දින,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණදෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.